## බලය බෙදීමේ අතාර්කික බව

බලය බෙදීම යන්නෙන් අදහස් කරන්නේ පාර්ලිමේන්තුව සතු ව්‍යවස්ථාදායක බලයෙන් යම් ප්‍රමාණයක් වෙනත් ආයතනවලට පවරාදීම ය. වෙනත් වචනවලින් කිවහොත් ඇතැම් කරුණු සම්බන්ධයෙන් ගත්කල රටේ යම් යම් ප්‍රදේශවලට බලපාන අණ පණත් සම්පාදනය පාර්ලිමේන්තුවෙන් බාහිර ආයතනවලට පැවරෙයි. එසේ බලතල පැවරීමෙන් පසුව සම්මත කෙරෙන අණ පණත් පාර්ලිමේන්තු අණ පණත් වැනි ය. ඒ පැවරෙන බලතල යම් යම් අවශ්‍යතා යටතේ පාර්ලිමේන්තුවට අවශ්‍ය පරිදි ආපසු පවරාගත හැකි ද නැත් ද මෙහි දී වැදගත් සාධකයක් වෙයි. බලතල ආපසු පවරා ගැනීමේ දී ඒ සඳහා කෝඳුරු තෙල් හත්පට්ටයක් සෙවීමට සිදුවන්නේ නම් එසේ බලතල ආපසු පවරාගැනීමට ඇති ඉඩකඩ කඩදාසියට පමණක් සීමාවන්නක් වෙයි. රටක ව්‍යවස්ථාවක් ඒකීය ද නැත් ද යන්න තීරණය වන්නේ ව්‍යවස්ථාවේ ඒකිය බව සඳහන් ද නැත් ද යන්න මත නොව අවසානයේ දී ඒ බලතල පැවරෙන ආයතන පාර්ලිමේන්තුවෙන් ස්වායත්ත ද නැත් ද යන්න මත ය. ශ්‍රී ලංකාව ඒකීය රාජ්‍යයක් යැයි ව්‍යවස්ථාවෙහි සඳහන්කර ක්‍රියාත්මකව ගත්කල සන්ධීය රාජ්‍යයක් බිහිකළ හැකි ය. ව්‍යවස්ථාසංශෝධනයක දී රටෙහි ඒකීය භාවය පිළිබඳ කිසිම සැකයක් මතු නොවන ආකාරයට ව්‍යවස්ථාව සම්පාදනය විය යුතු ය.

දහතුන්වැනි ව්‍යවස්ථා සංශෝධනයෙන් සංධීය රාජ්‍යයක් ඇතිවන බව එවක ශ්‍රෙෂ්ඨාධිකරණයේ විනිසුරුවන් හතරදෙනකු ම තීරණය කළ බව අමතක නො කළ යුතු ය. විනිසුරුවන් පස්දෙනකු ඒ ඒකීය ව්‍යවස්ථාවක් යැයි තීරණය කළ බැවින් දහතුන්වැනි ව්‍යවස්ථා සංශෝධනය පැවති ව්‍යවස්ථාවට එකඟ යැයි තීරණය විය. එහෙත් ඒ එක් වැඩි ඡන්දයකිනි. රටක අනාගතය තීරණය කරන එවැනි ව්‍යවස්ථා සංශෝධනයක් පිළිබඳව එක් වැඩි ඡන්දයකින් පමණක් තීරණයක් ගැනීම සතුටුදායක ද? රටේ ඒකීය භාවය පිළිබඳ තීරණයක දී  සියළු විනිසුරුවන් එකඟත්වයකට පැමිණීම වැදගත් නො වන්නේ ද? එහෙත් එවැනි තීරණයක් ගැනීම පිළිබඳ ව්‍යවස්ථාවේ කිසිවක් සඳහන් නොවීම මෙහි දී ප්‍රශ්නයක් විය හැකි ය. එසේ වුවත් එක් විනිසුරුවකු වුව ද යෝජිත ව්‍යවස්ථා සංශෝධනය ඒකීය නොවන්නේ යැයි තීරණය කරන්නේ නම් ඒ ජනාධිපතිතුමාගේ හා ආණ්ඩුවේ වගකිවයුත්තන්ගේ ඇස් අරින්නක් විය යුතු ය. සර්ව පාක්ෂික නියෝජිත කමිටුවේ ඇතැමුන් ආණ්ඩුවේ හා ජනතාවගේ ඇස්වලට වැලිගසා ඒකීය නමින් සංධීය රාජ්‍යයක් පිහිටුවීමට කටයුතු කරනු ඇත.      .

මෙහි දී අප සාකච්ඡා කිරීමට බලාපොරොත්තු වනුයේ ඒකීය රාජ්‍යයේ නෛතිකභාවය නො වේ. අපට අවශ්‍ය වනුයේ ඊනියා බලය බෙදීම කිසිම තර්කයකට (න්‍යායකට) අදාළ නොවන බව කීමට ය. පළමුවෙන් ම බලය බෙදන්නේ කුමන අවශ්‍යතාවක් ඉටුකරගැනීමට ද යන ප්‍රශ්නය හා ඒ කිනම් ප්‍රශ්නයකට පිළිතුරක් ලෙස ද යන ප්‍රශ්නය ඇසිය යුතු ය. එයට දෙමළ ජාතිවාදීන් (ඔවුන් අතර සිංහලයන් ද සිටිය හැකි ය) දෙන පිළිතුරු කවරේ ද? ඔවුන්ට අනුව ඒ මෙසේ ය. “1956න් පසුව දෙමළ ජනයාට අසාධාරණකම් රාශියක් කෙරී ඇත. (මේ ඊනියා අසාධාරණකම් එසේ නොවන බව පෙන්වා දී ඇත.)  ඒ අසාධාරණකම්වලට එරෙහිව දෙමළ ජනයා චෙල්වනායගම්ගේ ෆෙඩරල් පක්ෂය නමින් හැඳින්වුණු ඉලංකෙයි තමිල් අරසු කච්චි හෙවත් ලංකා දෙමළ රාජ්‍ය පක්ෂය  යටතේ අහිංසාවාදී ක්‍රියා මාර්ගවල නිරත වූහ. එහෙත් ආණ්ඩුව එයට විරුද්ධව පොලීසිය (හා මැරයන්) යොදවා හිංසාකාරී ලෙස ක්‍රියා කෙළේ ය. අවසානයේ දී වෙනත් කිසිවක් කරකියාගත නොහැකි වූ විට දෙමළ ජනයා 1976 දී වෙන ම රාජ්‍යයක් පිහිටුවාගැනීමට යෝජනාවක් සම්මත කරගෙන ඒ සාක්ෂාත් කරගැනීමට ක්‍රියා කළහ. ප්‍රභාකරන් බිහිවූයේ ද මේ ක්‍රියාදාමයෙහි ප්‍රතිඵලයක් ලෙස ය.”

ඒ වෙන ම රාජ්‍යය අඩුම තරමින් උතුරු හා නැගෙනහිර (ජාතික රූපවාහිනියෙහි ද ඇතැම් නිවේදක නිවේදිකාවන් තවමත් උතුරු නැගෙනහිර යනුවෙන් පවසන්නේ ඔවුන්ට චන්ද්‍රිකාගේ සිංහල විරෝධී ප්‍රතිපත්තියෙන් මිදීමට නොහැකි බව ප්‍රදර්ශනය කරමිනි.) පළාත්වල පිහිටුවීමට දෙමළ බෙදුම්වාදීහු ඉටාගෙන සිටිති. ඒ සඳහා ඔවුන් කියන්නේ උතුරු හා නැගෙනහිර පළාත්වල අනාදිමත් කාලයක් තිස්සේ දෙමළ රාජ්‍යයක් පැවති බව ය. ඇතැම්හු මේ ඊනියා දෙමළ රාජ්‍යය හලාවත සිට කුමන දක්වා විහිදී තිබුණි යැයි කියති. ප්‍රභාකරන්ගේ ඊළාම් සිතියමෙහි ද දැක්වෙන්නේ එවැනි භූමි ප්‍රදේශයකි. මෙවැනි ප්‍රදේශයක් පිරිවසා ලංකාවේ දෙමළ නොව කිසිම රාජ්‍යයක් තිබී නැත. එහි වැඩිමවුවහොත් තිබී ඇත්තේ යාපන අර්ධද්වීපයෙහි ආර්ය චක්‍රවර්ති රාජ්‍යය ය. එහෙත් ඒ රාජ්‍යය ද කිසි දිනෙක දෙමළ රාජ්‍යයක් නො වී ය. එයට හේතුව බටහිරයන් භාරතයට හා ලංකාවට පැමිණීමට පෙර දෙමළ නමින් ජනවර්ගයක් නො වීම ය. එකල දෙමළ කතාකරන ජනයා භාරතයේ විවිධ රාජ්‍යවල පදිංචි වී සිටියහ. දෙමළ කතාකරන ජනයා යන්නෙන් දෙමළ

© Prof. Nalin De Silva

ජනවර්ගයක් නො හැඳින්වෙයි. ඒ විවිධ රාජ්‍ය ඒ ඒ රජවරුන්ගේ වාංශික රාජ්‍ය මිස ජාතියක හෝ ජනවර්ගයක හෝ රාජ්‍ය නො වී ය. මෙරට ආර්ය චක්‍රවර්තීන්ගේ ද තිබී ඇත්තේ වාංශික රාජ්‍යයකි. එපමණක් නොව ඒ රාජ්‍යය සිංහල රාජ්‍යයෙන් ස්වාධීන වූ ස්වෛරී රාජ්‍යයක් ද නො වී ය. ප්‍රභාකරන්ගේ ඊනියා ඊළම අන්හිසිවක් නොව ලන්දේසීන්ගේ අධිකරණ කලාප තුනෙන් එකකි. (වැඩි විස්තර සඳහා ප්‍රභාකරන් ඔහුගේ සීයලා බාප්පලා හා මස්සිනාලා පොත කියවන්න. මේ පොත කාලය වෙබ් අඩවියෙන් - ඩබ්ලිව්ඩබ්ලිව්ඩබ්ලිව්.කාලය.ඕර්ග්-නොමිළයේ බාගත හැකි ය.)

ඉංගිරිසිහු මෙරට ජාති දෙකක් ඇතැයි කීවෝ ය. ඒ කිසිම ඓතිහාසික පදනමක් නැතිව ලෙග්හෝන් වාර්තාවෙන් පැන නගින්නකි. වෙන ම රාජ්‍යයක් ඉල්ලීමේ එක් පදනමක් වන්නේ ද ජාති දෙකේ කතාව ය. බටහිරයන් පැමිණෙන විට ජාති දෙකට වෙනම රාජ්‍ය තිබූ බව පවසන දෙමළ ජාතිවාදීහු බ්‍රිතාන්‍යයන් ආපසු යන විට ඊනියා දෙමළ රාජ්‍යයට නිදහස නොදී සිංහල රාජ්‍යයට පමණක් නිදහස දුන් බවත් දෙමළ රාජ්‍යය සිංහල රාජ්‍යය යටතට පත්කර ගිය බවත් කියති. ඔවුන්ට අනුව දැන් අවශ්‍ය වී ඇත්තේ සිංහල රාජ්‍යයෙන් දෙමළ රාජ්‍යය මුදාකර ගැනීම ය. එහෙත් මේ කතාව අසාධාරණකම් පිළිබඳ කතාවෙන් වෙනස් ය. මේ කතාවට අනුව දෙමළ ජාතිවාදීන් වෙන ම රාජ්‍යයක් ඉල්ලන්නේ ඊනියා අසාධාරණකම් නිසා නොව ඓතිහාසිකව දෙමළ ජනතාවට වෙනම රාජ්‍යයක් උරුම බැවිනි. මේ කතාවට අනුව ඊනියා අසාධාරණකම් නැතත් දෙමළ ජනයාට ඊළමක් හිමිවිය යුතු ය.

ප්‍රභාකරන් බටහිරයන් හා කලක් ඉන්දියාව ලබාදුන් ආයුධ අතට ගැනීමෙන් පසුව කොටි සංවිධානය අනභිබවනීය ඊනියා හමුදාවක් ලෙස හැඳින්වූ බටහිරයෝ, ඊනියා මධ්‍යස්ථ දෙමළ ජාතිවාදීහු හා ඔවුන්ගේ ඇබිත්තයෝ කොටින්ගෙන් සාමාන්‍ය දෙමළ ජනතාව මුදාගැනීමට නම් ඊළමට විකල්පයක් දිය යුතු බව ද ඒ සඳහා කොටින් සමග සාකච්ඡා කළ යුතු බව ද කීහ. මේ ඉල්ලීම පිටුපස එදා සිට ම ඉන්දියාව සිටියේ ය. අප ඉන්දියාවේ භූමිකාව දීර්ඝ වශයෙන් වෙනම සාකච්ඡා කළ යුතු ය. එක් සතියක ඉන්දියාවේ ඊනියා ප්‍රතිකුමන්ත්‍රණයක් ගැනත් ඊළඟ සතියේ අපට ආදරයෙන් අපේ වැරදි නිවැරදි කරගැනීමට ටොකු අනිමින් අවවාද දෙන වැඩිහිටි සොහොයුරකු වූ ඉන්දියාවක් ගැනත් ඊනියා දේශපාලන විග්‍රහ නමින් කවි සංකල්පනා ලියන්නන්ට ඉන්දියාවේ භූමිකාව පිළිබඳ මෙලෝ හසරක අවබෝධයක් නොමැති බව පැහැදිලි ය. ව්‍යාජ මාක්ස්වාදයක එල්ලී ආර්ථික හේතු සොයන්නන්ට දැන් ඉන්දියාවේ මැදිහත්වීම පෙනෙන්නේ ලංකාව චීනය සමග ඇතිකරගෙන තිබෙන ගිවිසුම්වලට දක්වන විරෝධයක් ලෙස ය!

ඉන්දියාවේ විසඳුම බලය බෙදීම ය. ඉන්දියාවට ඒ ගැලපුනත් අපට ඒ නො ගැලපෙයි. පළමුව ඉන්දීය ජාතිය යනු ඉංගිරිසින් විසින් ඇතිකරන ලද ජාතික රාජ්‍යයක බිහි කෙරුණු ජාතියකි. ඒ ඉංගිරිසින් විසින් ම ඇතිකරනු ලැබූ ජනවර්ගවල එකතුවකි. සිංහල ජාතිය පඬුඅබා රජු දවස ඇතිවූ ලොවේ පැරණිම ජාතීන් දෙකෙන් එකකි. ලන්දේසීන් හා බ්‍රිතාන්‍යයන් දෙමළ ජනයා මෙරටට ගෙන්වීමෙන් ඇතිකළ දෙමළ හා මුස්ලිම් ජනවර්ග සිංහල ජාතියට එකතුකරගන්නේ කෙසේද යන ප්‍රශ්නය විසඳීමට බලය බෙදීම අනවශ්‍ය වෙයි. දෙවනුව ඉන්දියාවේ මෙන් ඒ ඒ ජනවර්ග හෝ ඒ ඒ භාෂා කතාකරන ජනයා හෝ අතිමහත් බහුතරය වූ ප්‍රදේශ ලංකාවේ නැත. ලංකාවේ දෙමළ ජනයාගෙන් සියයට හැටකට වැඩි පිරිසක් උතුරු හා නැගෙනහිර පළාත්වලින් පිටත සිටිය දී ඒ පිටත සිටින ජනයාට සිදු වී ඇතැයි කියන ඊනියා අසාධාරණකම්වලට බලය බෙදීමෙන් විසඳුම් ලැබෙන්නේ කෙසේ ද යන්න ප්‍රශ්නයකි. අනෙක් අතට 1956න් පසු ඇතිවිණි යැයි කියන ප්‍රශ්නවලට විසඳුම් සෙවීමට 1949 දී බෙදුම්වාදී ඊනියා ෆෙඩරල් පක්ෂයක් පිහිටුවූයේ ඇයි ද යන්න ද ප්‍රශ්නයකි. මෙයින් පැහැදිලි වන්නේ ඊළම ඊනියා අසාධාරණකම්වලට විසඳුමක් නොව බටහිරයන්ගේ ආධාර ලබන දෙමළ ජාතිවාදයේ අවශ්‍යතාවක් බව ය. කෙසේ වෙතත් අද ප්‍රභාකරන්ගෙන් දෙමළ ජනයා ගලවාගැනීම පිළිබඳ ප්‍රශ්නයක් නැත. එබැවින් ඊළමට විකල්පයක් සෙවීමට ද අවශ්‍ය නැත. බලය බෙදීම යන්න ඇති ප්‍රශ්නයකට ඉදිරිපත්කරන විසඳුමක් නොව දෙමළ ජාතිවාදයේ අවශ්‍යතාවක් වූ ඊළමට විකල්ප වශයෙන් ඉදිරිපත්කරන ඊළමක් දිශාවට වූ ඊනියා විසඳුමකි. එහි දී ඊනියා විසඳුම යනු ප්‍රශ්නයේ ම කොටසක් බව පැහැදිලි ය. ඊනියා අසාධාරණකම් යනු ඊළමෙහි කොටසක් වූ (වෙල්වනායගම්ගේ දැන් ටිකක් පසුව තවත් යන්න මෙහි දී වැදගත් වෙයි) සංඝීය රාජ්‍යය යුක්ති යුක්ත කිරීමට දෙමළ ජාතිවාදීන් නිර්මාණය කළ කරුණු ය. ඒ අසාධාරණකම් යනු ඇතැම් විට බ්‍රිතාන්‍යයන් යටතේ ඉංගිරිසි කතාකරන දෙමළ ජනයා භුක්තිවිඳි වරප්‍රසාද නැතිවීමක් ද වෙයි.

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva